# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,449 - 2025 අගෝස්තු මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2025.08.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 1002 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 අගෝස්තු 29 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 අගෝස්තු 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1001 - B 082709— 5,403 (2025/08)
F 1 -

# විවිධ දැන්වීම්

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා පෝරම ගාස්තු හා වෙනත් සේවා ගාස්තු අය කිරීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2025 ජූලි මස 11 වැනි දින පවත්වන ලද ගරු මහා සභාවේ ඊ 29 දරන තීරණය අනුව පහත දැක්වෙන සංශෝධනය සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. එච්. එම්. පී. දර්ශන වෛද්‍යාරත්න,
සභාපති,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2025 ජූලි මස 11 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2025 සැප්තැම්බර් මස 01 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි පහත ආකාරයට යන්ත්‍ර සූත්‍ර හා වාහන කුලියට දීම යටතේ බැකෝ ලෝඩරය (JCB) යන්ත්‍රය සඳහා ගාස්තු අය කිරීමට තීරණය කරන ලදී.

බැකෝ ලෝඩරය (JCB) මීටර් පැය එකක ගාස්තුව රු. 5,000.00

එම තීරණය අනුව මෙතෙක් අය කළ ගාස්තුව රුපියල් 5,500.00 සිට රුපියල් 5,000.00 දක්වා අඩු කෙරෙන අතර, ඉල්ලුම් කරනු ලබන කාලය පැය 02 ක් හෝ 2ට වඩා අඩුවන අවස්ථාවේ දී පළමු කිලෝමීටරය සඳහා රු. 750.00 ක් ද, එතැන් සිට වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහාම රු. 500.00 බැගින් ද, ප්‍රවාහන ගාස්තුවක් අය කෙරේ.

පැය දෙකකට වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රවාහන ගාස්තුවක් අය කරනු නොලැබේ.

08-59

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.